# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2032/29 - 2017 අගෝස්තු මස 17 වැනි බ්‍රහස්පතින්දා - 2017.08.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ යොමු අංකය* : 4/1/ඉ/අත්පත්/79.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/9/2015/WS/30.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි:

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර* :

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, මල්ලවපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 711, මල්ලවපිටිය ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, තෙලියගොන්න ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් මැන සකස් කරන ලද, 2017.07.06 දිනැති, අංක කු 2374 දරන මූලික පිඹුරේ කැබලි අංක 1 වශයෙන් දැක්වෙන "කෝන්ගහමුල වත්ත" නැමති ඉඩමෙන්, මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0334 ක් පමණ වන පහත මායිම් තුළ පිහිටි ඉඩම් කොටස.

**කැබලි අංකය 01**

ඉඩමේ නම: කෝන්ගහමුල වත්ත; හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය : රිෂානා මහරූෆ් මහත්මිය, අංක 59, උඩයාර් මාවත, තෙලියගොන්න; ප්‍රමාණය: හෙක්. 0.0334.

*මායිම්* :

*උතුරට*: එන්. එච්. හලාල්දීන් හිමිකම් කියන කෝන්ගහමුල වත්ත; *නැගෙනහිරට*: ඇල; *දකුණට*: හිජ්රා මාවත; *බටහිරට*: නූර් සදීකා හිමිකම් කියන කෝන්ගහමුල වත්ත සහ උම්මු සල්මා හිමිකම් කියන කෝන්ගහමුල වත්ත.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2017 ඔක්තෝබර් මස 16 වැනි දින පෙ. ව. 10.00 ට මල්ලවපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2017 ඔක්තෝබර් මස 09 වැනි දිනට මත්තෙන්, ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි. හිමිකම් කීම පිළිබඳ ඔප්පු ආදිය පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුය.

ආර්. එම්. පී. රත්නායක,
ප්‍රාදේශීය ලේකම්,
මල්ලවපිටිය.

2017 අගෝස්තු මස 15 වැනි දින,
මල්ලවපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

08 - 1083